# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/8 – 2014 මැයි 05 වැනි සඳුදා – 2014.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1392/6 හා 2005.05.10 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2005 අංක 42 හා 2005.05.10 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1759/36 හා 2012.05.25 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2005 අංක 42 හා 2005.05.10 වැනි දින දරන ආඥාවට යටත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අංක 02 සහ 03 පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන් ,  
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2004/ඩබ්එස්/11.  
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/2/1/63.  
2014 අප්‍රේල් මස 28 වැනි දින,  
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,  
"මිහිකත මැදුර" රජමල්වත්ත පාර,  
බත්තරමුල්ල.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කොස්පිටියන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/දො/2004/219 හා 2013.11.15 දිනැති සංශෝධිත ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි දෙකට මායිම්:

01. **කැබලි අංක 2 – කෙසෙල්ඕවිට, මඩවැල්ඕවිට නොහොත් පත්තෑයන්ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0025 ක් පමණ**

උතුරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පවුලේ සුසාන භූමිය; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පවුලේ සුසාන භූමිය; දකුණට: කැළණි ගඟ සහ කැබලි අංක 1; බටහිරට: කැබලි අංක 1 සහ මාර්ගය.

02. **කැබලි අංක 3 – කෙසෙල්ඕවිට, මඩවැල්ඕවිට නොහොත් පත්තෑයන්ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0884 ක් පමණ**

උතුරට: මාර්ගය සහ කැබලි අංක 1; නැගෙනහිරට: කැබලි අංක 1 සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ඉඩම; බටහිරට: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ඉඩම සහ මාර්ගය.

05 - 576


1A – G 019513 – 145 (2014/05)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1981 දෙසැම්බර් මස 17 වැනි දින අංක 171/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 1981 අංක 332 දරන (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක ත්‍රි/ඒ/80/07 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර ඒඑස් සහ ඒටී යන ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 79එන්650(1).
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ඩීඑස්/ටීජී/එල්එන්ඩී/ටීඕයූබෝඩ්.
2014 අප්‍රේල් මස 30 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

නැගෙනහිර පලාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමල නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩ්ඩුක්කුලම් පත්තු සුළු කොට්ඨාසයේ උප්පවේලි, කොට්ඨාස අංක 43 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උප්පවේලි ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 27 හා 2014.03.27 වැනි දින දරන මූලික පිඹුරේ කැබලි අංක 597 හා 598 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.6723 ක් පමණ වන ඇලස්තෝටම් නමැති ඉඩම් කොටස් දෙකට මායිම්:

01. **කැබලි අංක 597 – ඇලස්තෝටම් – ප්‍රමාණය: හෙක්. 3.0272ක් පමණ**
උතුරට: කැබලි අංක 02; නැගෙනහිරට: මුහුද සහ කැබලි අංක 144; දකුණට: කැබලි අංක 598; බටහිරට: කැබලි අංක 07.

02. **කැබලි අංක 598 – ඇලස්තෝටම් – ප්‍රමාණය: හෙක්. 3.6451ක් පමණ**
උතුරට: කැබලි අංක 597; නැගෙනහිරට: මුහුද; දකුණට: කැබලි අංක 599; බටහිරට: කැබලි අංක 07.

05 - 577

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2009 ජනවාරි මස 15 වැනි දින අංක 1584/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2009 අංක 09 දරන ආඥාවෙන් කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: LD/05/2008/NRD/215.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බෙ/ඉ/2/අත්/35-5.
2014 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු ගිරුවාපත්තුව පත්තු සුළු කොට්ඨාසයේ ගලගම (අ.ග.පි. 301) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක H/BLA/2008/572 හා 2008.10.26 වැනි දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ''ඒ'' – කොස්ගහ හේන නොහොත් අළුත්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.5205ක් පමණ**
උතුරට: මිරිස්වත්තහේන සහ බොකලගෙහේන; නැගෙනහිරට සහ දකුණට: අළුත්වත්ත; බටහිරට: මිරිස්වත්තහේන.

05 - 579

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 377 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2012/WS/56.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: දො/ඉ/01/අත්/105.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයට යටත්ව අංක 1840/22 හා 2013.12.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 28ජ් පිටුවේ පළ කරන ලද 2013 අංක 377 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ ''ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0144 යන්න'' වෙනුවට ''ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3170 යන්න'' ලෙසත් ''ඉඩම් කැබලි දෙකට (02) මායිම්'' යන්න වෙනුවට ''ඉඩම් කැබැල්ලට මායිම් ලෙසත්'' පහත අංකය යටතේ විස්තර වන ඉඩම් කැබැල්ල ඉවත්වන ලෙසත් ඉහත සඳහන් ආඥාව සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01. **කැබලි අක්ෂර ''බී'' – වෝගන්වත්ත දීගල්ල කොටස – ප්‍රමාණය: හෙක්. 0.6974**

උතුරට: වතුපාර; නැගෙනහිරට: වතුපාර සහ කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන වෝගන්වත්ත දීගල්ල කොටස; දකුණට: කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන වෝගන්වත්ත දීගල්ල කොටස; බටහිරට: කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන වෝගන්වත්ත දීගල්ල කොටස සහ වතුපාර.

05 - 578

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.